# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2024 අංක 30 දරන කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජුනි මස 14 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 30 දරන කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 12 වන දින]

එල්. ඩී.– ඕ. (අයි. එන්. සී.) 6/2021

## කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, එම සමිතියේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී සමිතියට සම්බන්ධ කාරණා ඉටු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී සමිතිය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක 30 දරන කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය සංස්ථාගත කිරීම

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු ''සමිතිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාපිත මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය පාවිච්චි කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ට භාවනා ක්‍රම සඳහා අවශ්‍ය කරන්නා වූ පහසුකම් සැලසීම;

(ආ) බුදු දහම පිළිබඳව ලියැවුණු සහ ලොවපුරා පළ වූ ග්‍රන්ථ සහ සඟරා රැස්කර ඒවා ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ට පහසුවෙන් ප්‍රවේශවීමට අවශ්‍ය කරන්නා වූ විධිවිධාන සැලසීම;

(ඇ) ශ්‍රී ලංකාවේ ජනතාවට වඩාත් යහපත් හෙට දවසක් උදාකර දීම සඳහා ඔවුන් දරනු ලබන පරිශ්‍රමය වෙනුවෙන් ඔවුන්ට සහාය ලබා දීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ සමාජ සේවකයන්, විද්වතුන්, දානපතියන් හා පරාර්ථකාමී පුද්ගලයින් සහ සුභසාධන සමිති හා සුභසාධක පදනම් සමඟ සම්බන්ධීකරණය කිරීම සහ ඔවුන් සමඟ යහපත් සම්බන්ධතාවන් වර්ධනය කිරීම;

(ඈ) අදහස් සහ පළපුරුද්ද හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණු ඇතිව එකී බෞද්ධ සමිතියේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා බෞද්ධ සමාජයට අවශ්‍ය විය හැකි බුදුදහම සහ බෞද්ධ දර්ශනය පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ, අත්පත්‍රිකා සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම බෙදාහැරීම;

(ඉ) සමිතියට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හා සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ඊ) අධ්‍යාත්මික ශාන්තිය අපේක්ෂා කරන සියලුම පුද්ගලයින්ට බුදුදහමේ මූලික ඉගැන්වීම් පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම තුළින් සහාය ලබා දීම.

රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමඟ ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලය විසින් සිය පරමාර්ථ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු අතර, එම පරමාර්ථ, ආණ්ඩුවේ යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමග ගැටුම් සහගත තත්ත්වයක් ඇති නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ධුර දරන්නන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලබන සමිතියේ මණ්ඩලයේ සාමාජිකයන්, (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරාපත් කරනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලය ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත් කර ගැනීම සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු මණ්ඩලයේ යම් තීරණයක් එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම මණ්ඩලය පත් කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව මණ්ඩලයේ ධුර දරන සෑම ධුර දරන්නකු ම වසර තුනක කාලයක් සඳහා පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු අතර, එම වසර තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එකී ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා, නැවත පත්කර ගනු ලැබීමට හෝ තෝරාපත් කර ගනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, අකාර්යක්ෂමතාවය හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගනු ලැබීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාපත් කර ගනු ලැබූ හෝ පත්කර ගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය :-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සෘජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ

සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් යම් ගිවිසුම් හෝ පොරොන්දු පත්‍රයන්ට ඇතුළත් වීම, ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඈ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ අරමුදල් රැස්කිරීම, ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයට දෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ලද ශ්‍රී ලංකාවේ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල දේපළක් හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලය සතු පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන් හි දී සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු ;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම හෝ ධුර දරන්නන්ගේ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයින් සහ සේවකයන්ගේ පත්වීමේ නියම සහ කොන්දේසි, බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ මණ්ඩලයේ යම් රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් හා එහි න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීමේ ආකාරය පාලනය කරනු ලබන කාර්ය පටිපාටිය ;සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති, එකී රීති සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාමලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල් 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ එකී සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි ව්‍යාපාර ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරි ව්‍යාපාර ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

11. (1) මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද, විගණකාධිපතිවරයා හෝ 10 වන වගන්තියේ සඳහන් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් හෝ සහතික කරන ලද සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ලැයිස්තුවක් ද සමග, වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ බුද්ධ ශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක්, සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා පිළිබඳ විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති අමුණා තිබිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතිය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය සහ සමිතියට ගෙවිය යුතු සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයට චංචල හා නිශ්චල දේපළ දරනු ලැබිය හැකි බව

13. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සභාවේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, උචිත ආයතනය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.